NPS/NPA2020/PUB/01

# ජාතික ඵලදායිතා සම්මාන 2020

දුරස්ථ ඇගයීමට අදාළ උපදෙස් පත්‍රිකාව

2020 ජාතික ඵලදායිතා සම්මාන තරගාවලියේ ක්ෂේත්‍රගත ඇගයීම් ක්‍රියාවලිය මේ වන විට රට තුළ පවතින COVID- 19 වසංගත තත්ත්වය හමුවේ අපේක්ෂා කළ පරිදි සිදු කිරීමට නොහැකි වී ඇති බැවින් දුරස්ථ ඇගයීම් ක්‍රියාවලියක් ලෙස සිදු කිරීමට කටයුතු යොදා ඇත. මේ සම්බන්ධව ආසියානු ඵලදායිතා සංවිධානයේ ද යහපත් පරිචයන් අනුගමනය කරමින් මෙතෙක් අප සිදු කළ ක්ෂේත්‍ර ගත ඇගයීමට සමානව මෙම ඇගයීම ද සිදු කිරීමට සංවිධානය කර ඇති අතර ඒ සඳහා ඔබ ආයතනයේ පූර්ණ දායකත්වය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමු.

මෙම දුරස්ථ ඇගයීම් ක්‍රියාවලිය අදියර දෙකකට යටත්ව සිදු කෙරේ.

## පළමු අදියර

ඔබ විසින් එවන ලද අයදුම්පතෙහි එක් එක් නිර්ණායකයන්ට යටත්ව අදාළ තොරතුරු සත්‍යාපනය කරගැනීම සඳහා දත්තයන්, ලේඛන සහ එයට අදාළව සකස් කළ වීඩියෝ පට විගණනය ආරම්භ කිරීමට අවම වශයෙන් දින 05 කට පෙර ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලීය වෙබ් අඩවියේ සඳහන් කර ඇති දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ විද්‍යුත් ලිපිනයන් වෙත එවීමට සූදානම්කොට තබා ගත යුතුය.

**(අයදුම්පතේ නිර්ණායක සත්‍යාපනය කිරීමට අවශ්‍ය උපදෙස් පත්‍රිකාව, ඇමුණුම 1 - රාජ්‍ය අංශය, ඇමුණුම 2 - පාසැල් අංශය, ඇමුණුම 3 - නිෂ්පාදන හා සේවා අංශය)**

## දෙවන අදියර

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය මඟින් පත් කරන ලද විනිශ්චය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගේ සහභාගීත්වයෙන් **වීඩියෝ සාකච්ඡාවක් (Zoom Meeting)** පැය 02 ක කාලයක් තුළ සිදු කිරීමට කටයුතු යොදා ඇත.

අපගේ තාක්ෂණික කමිටුව විසින් විගණනයට දින දෙකකට පෙර ඒ සඳහා ඔබ ආයතනයට අවශ්‍ය සියලුම තාක්ෂණික උපදෙස් ලබා දේ.

එම දිනයේදී ඔබ ආයතනයේ සිදුවන විගණනය නිරීක්ෂණය කිරීම සඳහා අපගේ ඵලදායිතා සංවර්ධන නිලධාරියෙකු පැමිණෙන අතර ඔහු/ඇය ඔබ ආයතනයේ COVID 19 නීතිරීති වලට අනුගතව කටයුතු කරනු ඇත. එම නිලධාරියාට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

**වීඩියෝ සාකච්ඡාව (Zoom Meeting)**

1. ආයතන ප්‍රධානියා සමඟ විනාඩි 10 ක ප්‍රධාන සාකච්ඡාවක් පැවැත්වීම.
2. ආයතනය විසින් පත් කරනු ලබන නිලධාරියෙකු ජංගම දුරකථනයක් ද (Megapixel 32-64 ප්‍රමාණයක් ඇති කැමරාවක් සහිත) අතැතිව ආයතනයට පිවිසීමේ සිට සියලුම අංශ ආවරණය වන පරිදි විනිශ්චය මණ්ඩලය ලබා දෙන උපදෙස් අනුව ඒ ඒ අවස්ථාවට අදාළව කැමරාව සහ මයික්‍රෝෆෝනය භාවිතා කරමින් පැහැදිළි කළ යුතුය.
3. උප කාර්යාල, ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙන් පිටත ඇති විට දී එම කාර්යාල ප්‍රධානියා ඇතුළු කාර්ය මණ්ඩලය එම ස්ථානයේ සිට ZOOM තාක්ෂණය ඔස්සේ මෙම විගණනයට සම්බන්ධ විය යුතු අතර එයට අවශ්‍ය තාක්ෂණික මෙවලම් සියල්ල සූදානම් කර තබා ගත යුතුය.
4. සෑම අංශයකටම, උප කාර්යාලයකටම ඇතුල් වීමට පෙර එහි ඉදිරිපස පෙනුම, අංශයේ නාම පුවරුව හා ඇතුල් වන ස්ථානය හොඳින් පෙන්විය යුතුය.
5. ප්‍රධාන අංශ ආවරණය කරන අවස්ථාවල දී සෑම අංශ ප්‍රධානියෙකුම තම අංශය පිළිබඳව විනාඩි 05 ක ඉදිරිපත් කිරීමක් කළ යුතු අතර සීමිත කාලයක් ඇති බැවින් කාල කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුය.
6. තව ද එම අංශ ආවරණයේ දී කැමරා දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් භාවිතා කළ යුතු අතර සෑම විටම එක් කැමරාවක් මුළු අංශයම ආවරණය වන පරිදි අංශයේ ඉදිරිපස චලනය නොවන සේ ස්ථානගත කළ යුතු වේ. අනෙක් කැමරාව අංශයේ නිලධාරීන් වෙත යොමු කළ යුතු අතර ඔවුන් සමඟ සාකච්ඡා කිරීමට, ඔවුන්ගේ

රාජකාරි මේසයේ වපසරිය, ගොනු රඳවා තිබෙන රාක්ක ආදිය විනිශ්චය මණ්ඩලය වෙත පෙන්වීමට යොදාගත යුතුය.

7. විනිශ්චය මණ්ඩලයට අවශ්‍ය පරිදි අවශ්‍ය ස්ථාන පෙන්වීම,ලේඛන පෙන්වීම, පරිගණක දත්ත පද්ධති පෙන්වීම, අවශ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා පැවැත්වීමට යොමු කිරීම ආදී සියල්ල ජංගම දුරකථන අතැති නිලධාරියා විසින් ආවරණය කළ යුතුය. (මේ සඳහා නිලධාරීන් කිහිප දෙනෙකු වුව ද යොදාගත හැකිය.)
8. එම කාර්යයන් අතර තුර විනිශ්චය මණ්ඩලයට අවශ්‍ය ලේඛණ (Document) ZOOM තාක්ෂණය ඔස්සේ එවීමට තවත් නිලධාරියෙකු සූදානමින් සිටිය යුතුය. (ZOOM → Chat → File Sharing )
9. ස්වභාවික හෝ නොවැලැක්විය හැකි කාරණාවල (හදිසි විදුලි විසංධි වීම්, අන්තර්ජාල අවහිරතා, කාලගුණික බාධාවන්) දී විගණනයට බාධා නොවන පරිදි විකල්ප යොදාගත යුතුය.
10. මෙම දුරස්ථ ඇගයීම් ක්‍රියාවලිය මඟින් අප වෙත එවන ලද අයදුම්පතේ තොරතුරු සත්‍යාපනය කොට ගෙන තරඟාවලියේ ඔබට හිමි ස්ථානය ලබාදීම මූලික අරමුණ වන අතර පළමු හා දෙවන ස්ථාන තීරණය කර ගැනීම සඳහා පමණක් (අවශ්‍ය වූවහොත්) ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීමට නියමිතය.
11. එලෙස මෙම අදියර දෙක යටතේ ඔබ සෑහීමකට පත්වෙන ලෙස සියලුම කරුණු ඉදිරිපත් කිරීමට ඔබට අවස්ථාව ලබා දී ඇති අතර ඉදිරිපත් නොකරන කරුණු පිළිබඳව ලකුණු ලබා දීමට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය බැඳී නොසිටින බව ද දන්වා සිටිමු.
12. මෙම සියලුම විගණනයන්ට අදාළ සංවාදයන් හා රූප රාමු අප පරිගණකය තුළ පටිගත වන බව අවධාරණය කළ යුතුය.
13. විනිශ්චය මණ්ඩලය වෙත ඔබට පෙන්වීමට අවශ්‍ය සියලුම වීඩියෝ, යූටියුබ් ගිණුමක් (youtube Account) සාදා එයට උඩුගත (Upload) කළ යුතු අතර එහිදී Unpublish mode අකාරයෙන් ඒවා Save කළ යුතුය. ඉන්පසු ඔබගේ එම යූටියුබ් ගිණුමට අදාළ සබැඳිය (youtube Account Link) ඔබ දිස්ත්‍රික්කයට අදාළව දී ඇති විද්‍යුත් ලිපිනය (e – mail) මඟින් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත එවිය යුතුය. (මෙහිදී ඔබ විසින් උඩුගත (Upload) කරනු ලබන වීඩියෝ පට කිසිඳු බාහිර පාර්ශවයකට බැලීමට නොහැකි වන අතර අදාළ සබැඳිය (Link) ආධාරයෙන් පමණක් බැලිය හැක.)